## <u>මධ්‍යම පළාත් සභාවේ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ පළාත් ඉඩම් සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය.</u>

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් මීට පෙර අනුමත කර ඇති බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන යටතේ ගන්නා ලද හෝ දැනට ගෙන ඇති යම් ක්‍රියාමාර්ගයකට හානියක් නොවන පරිදි මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලද දින සිට ක්‍රියාත්මක වනු ඇත.

**1. සම්බන්ධ වන ආයතනය:**

1.1. දෙපාර්තමේන්තුව : මධ්‍යම පළාත් සභාවේ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

යොමු අංකය : සිපිසි/එල්සී/ඊ/15/02/10 දිනය : 2017.01.31

1.2. අමාත්‍යාංශය : මධ්‍යම පළාත් සභාවේ ඉඩම් විෂය භාර අමාත්‍යාංශය

යොමු අංකය : සිපිසි/සිඑම්එස්/1/3/cadre දිනය : 2017.01.26

1.3. කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම :

යොමු අංකය : ඩිඑම්එස්/ඩි/පොදු/11-2 දිනය : 2012.12.19

1.4. මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය :

යොමු අංකය : සිපිසි/සිඑස්/2/3/S.M./C (VI) දිනය : 2017.09.13

1.5. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :

යොමු අංකය : එන්එස්සිසී/10/71/2/එස්ආර් දිනය : 2017.12.26

1.6. මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :

යොමු අංකය : CPC/PSC/30/ACL/SOR දිනය : 2018.01.02

**2. පත් කිරීමේ බලධරයා** : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**3. සේවා ගණය පිළිබඳ විස්තර**

3.1. සේවා ගණය : විධායක

3.2. ශ්‍රේණි : III/II ශ්‍රේණි

3.3. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

ආයතනයෙහි කාර්යයන් ඉටු කිරීම හා පවත්වාගෙන යාමේදී අවශ්‍ය වන මූලික පහසුකම් සම්පාදනයට අදාල වන ඉඩම් සම්බන්ධ නීතිමය/අධිකරණ කටයුතු ව්‍යවස්ථාපිත/ ව්‍යවස්ථාපිත නොවන රාජකාරි හා ඉඩම් කොමසාරිස් විසින් ඒ තනතුරට අදාළව විශේෂිත කොට දක්වනු ලබන කාර්යයන් තනතුරට පැවරේ.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.02.23 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

3.4. කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවා අවශ්‍යතාවය මත දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැකිය.

**4.** තනතුරෙහි ස්වභාවය : ස්ථිර විශ්‍රාම වැටුප් සහිත

**5.** වැටුප්

5.1. වැටුප් කේත අංකය : SL 1 – 2016

5 2. වැටුප් පරිමාණය : රු. 47,615 – 10 x 1,335 – 8 x 1,630 – 17 x 2,170 – 110,895/-

5.3. ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| III | 01 | 47615/- |
| II | 12 | 62595/- |

5.4 වැටුප් ගෙවීම හා අනෙකුත් කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධාන අනුව විය යුතුය.

**6.** නිලධර ගණයට අයත් අනුමත තනතුරු :

6. 1. අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාමය | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| පළාත් ඉඩම් සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) | III / II | 01 | "1" පරිශිෂ්ඨයේ සඳහන් වේ. |

6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව 01 කි. ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස්වීම් කාර්යය සඳහා III හා II ශ්‍රේණින් සියල්ල ඒකාබද්ධ සේවයේ නිලධර සංඛ්‍යාවට අයත් ලෙස සැලකේ.

**7.** බඳවා ගැනීමේ ක්‍රමය

7.1. බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | - |
| සීමිත | - |
| කුසලතා | 100% |

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.02.23 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

7.2. බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.2.2. සුදුසුකම්

7.2.2.1 වෘත්තිය සුදුසුකම් : මධ්‍යම පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ලංකා තාක්ෂණ සේවයේ ජනපද නිලධාරි තනතුරේ (විශේෂ ශ්‍රේණියේ) නිලධරයකු ලෙස අවම වශයෙන් වසර 02 ක වත් සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අයෙකු වීම.

සහ

අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්නයෙන් වූ වසර පහක (05) කාලය තුල විනය දඬුවම් ලබා නොමැති වීම සහ වැටුප් වර්ධක නිසි ලෙස උපයාගෙන තිබීම.

7.2.2.2. පලපුරුද්ද : 7.2.2.1 අදාල වෘත්තිය සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

7.2.2.3 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි කටයුතු ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.2.2.4 වෙනත් සුදුසුකම් : තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.2.2.1 දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කල යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 බඳවා ගැනීමේ ක්‍රමය : මධ්‍යම පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ඉහත 7.2.2.1, 7.2.2.3 සහ 7.2.2.4 සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධරයන්ගෙන් අයදුම්පත් කැඳවා ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාව මත පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ලකුණු ප්‍රමුඛතාවය මත බඳවා ගනු ලැබේ.

7.2.3.1 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අභ්‍යන්තර නිවේදනයක් නිකුත් කිරීම මගින් සහ වෙබ් අඩවියේ දැන්වීම් පල කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.02.23 දින
ආණ්ඩුකාර ලේකම්

7.2.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ව්‍යුහය:

| පරීක්ෂණය කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| ජ්‍යෙෂ්ඨත්වය | ලකුණු 40 |
| කාර්යසාධන වාර්තා | ලකුණු 30 |
| විශේෂ වාර්තා | ලකුණු 10 |
| වාචික පරීක්ෂණය | ලකුණු 20 |
| එකතුව | ලකුණු 100 |

7.2.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධාරියා :

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.2.4.2 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ව්‍යුහය :

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය අවම වශයෙන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු වන අතර, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් හෝ ඔහු විසින් බලය පවරන ලද ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියකු, මධ්‍යම පළාතේ ඉඩම් විෂය භාර අමාත්‍යාංශ ලේකම් හෝ ඔහු විසින් බලය පවරන ලද ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියකු, හා මධ්‍යම පළාතේ පළාත් ඉඩම් කොමසාරිස් මෙම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන් විය යුතුය.

8. කාර්යක්ෂමතා කඩඉම් :

| කුමන කාර්යක්ෂමතා කඩ ඉමක්ද යන වග | කාර්යක්ෂමතා කඩඉම් සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද, | කාර්යක්ෂමතා කඩඉම් ස්වභාවය/ ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය සහතික පාඨමාලා /වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III වන ශ්‍රේණියට පත් වී වසර 03 ක් ගතවීමට පෙර | ඇමුණුම 01 |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට පත් වී වසර 03 ක් ගත වීමට පෙර | ඇමුණුම 02 |

8.1 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද :

වසරකට දෙවතාවක්

8.2. කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.02.23 දින
අනු[illegible] ලදී.
ආණ්ඩුකාර ලේකම්

## 9. භාෂා ප්‍රවීණතාව

| භාෂාව | ලබා ගතයුතු ප්‍රවීණතාව |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| අනෙකුත් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට ආනුශාංගික චක්‍රලේඛ අනුව අදාල මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |
| සන්ධාන භාෂාව | ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අ.පො.ස.(සා.පෙළ) සම්මාන මට්ටමේ ප්‍රවීණතාවක් III වන ශ්‍රේණියේ වසර 5 ක් ඉක්ම වීමට පෙර ලබා ගත යුතුය. |

## 10. ශ්‍රේණි උසස් කිරීම

10.1. III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම.

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. නිලධර ගණයේ III වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහයක (10) සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් වීමේ දිනට පූර්වාසන්න වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.

VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය : ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා නියමිත ආකෘති පත්‍රය අනුව පත් කිරීමේ බලධාරියා වෙත අදාළ නිලධාරින් විසින් ඉල්ලීම් කරනු ලැබූ විට, පත් කිරීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව, සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි උසස්වීම සිදු කරනු ලැබේ.

## 11. අන්තර්ග්‍රහණ ක්‍රමවේදය :

(නියමිත දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ.)

මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින පළාත් ඉඩම් සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) තනතුරට පත් කර ඇති නිලධාරින් මෙම බඳවා ගැනීමේ පරිපාටිය යටතේ පළාත් ඉඩම් සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ. අන්තර්ග්‍රහණය හේතුවෙන් වැටුප් පියවර හෝ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවේ.



ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.02.23 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

**12.** අර්ථ නිරූපණ හා නිර්වචන :

12.1 "බඳවා ගැනීමේ පරිපාටිය" වශයෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ පළාත් ඉඩම් සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටියයි.

12.2 "ගරු ආණ්ඩුකාරතුමිය" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමිය/තුමා වේ.

12.3 "කොමිෂන් සභාව" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

12.4 "ප්‍රධාන ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වේ.

12.5 "ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වේ.

12.6 "අමාත්‍යාංශ ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ඉඩම් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.

12.7 "දෙපාර්තමේන්තු ප්‍රධානියා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ පළාත් ඉඩම් කොමසාරිස් වේ.

12.8 "සතුටුදායක සේවා කාලය" යනුවෙන් අදහස් කරනුයේ රජයේ නිලධාරියෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරීම මගින්ද, සමත්විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම සමත් වීම මගින්ද, සිදු කළ යුතුව තිබූ පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද, එම කාලය තුළදී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වන්නේය.

12.9 "සක්‍රිය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියේ යෙදී සිටින සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාලපරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

**13.** සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ රජය හා/හෝ පළාත් සභාව විසින් කලින් කලට පනවනු ලබන නීතිරීති හා රෙගුලාසි අදාළ වේ.

**14.** මෙම බඳවා ගැනීමේ පරිපාටියේ යම් කරුණක් සම්බන්ධයෙන් හෝ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් සම්බන්ධයෙන් පැන නගින ගැටළුවක දී මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගරු ආණ්ඩුකාරතුමිය විමසා ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය පරිදි තීරණය කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.02.23 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

"1 පරිශිෂ්ඨය"

පළාත් ඉඩම් සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා
පැවරෙන කාර්යයන්

01. නෛතික කටයුතු

(I) පළාත් ඉඩම් කොමසාරිස් බලය පවරනු ලබන සියලුම අධිකරණ කටයුතු සඳහා පළාත් ඉඩම් කොමසාරිස් වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටීම.

(II) පළාත් ඉඩම් කොමසාරිස් පාර්ශවකරුවෙකු වශයෙන් යොමු කරන අධිකරණ කටයුතු වලදී අවශ්‍ය වාර්තා සකස් කිරීම අධීක්ෂණය හා අවශ්‍ය අවස්ථා වලදී පළාත් සභා නීති නිලධාරින්ගේ සහය ලබා ගැනීම.

(III) සියලු අධිකරණ කටයුතු වලදී නීතිපති දෙපාර්තමේන්තුව සමඟ හා අධිකරණය සමඟ සම්බන්ධීකරණය.

02. ඉඩම් ප්‍රදාන විශේෂ විධිවිධාන පනත යටතේ.

(I) මධ්‍යම පළාත තුළ රජයට ඉඩම් පවරා ගැනීමේ කටයුතු.

(II) හිමිකම් සහතික හා නියාදන සහතික නිකුත් කල ඉඩම් වල ආරවුල් පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

(III) නියාදන සාධන පත්‍ර වල පසු කටයුතු ඉටු කිරීම.

(IV) මාසික ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම.

03. පළාත් ඉඩම් කොමසාරිස් විසින් අවස්ථානෝචිතව පවරනු ලබන වෙනත් රාජකාරි ඉටු කිරීම.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.02.23 දින
[illegible]
ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම : 01

<u>මධ්‍යම පළාත් සභාවේ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ</u>
<u>පළාත් ඉඩම් සහකාර කොමසාරිස් ( දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා වන</u>
<u>පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය</u>

1. විභාගයේ නම : මධ්‍යම පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ පළාත් ඉඩම් සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

2. විභාග පිළිබඳ විස්තර :

| ප්‍රශ්ණ පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. ආයතන සංග්‍රහය | පැය 01 | 100 | 40 |
| 2. මුදල් රෙගුලාසි | පැය 01 | 100 | 40 |

3. විභාග පවත්වනු ලබන බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

4. විභාග පවත්වනු ලබන කාලසීමාව : අවම වශයෙන් වසරකට එක් වරක්.

5. විභාග සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්ණ පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| 1. ආයතන සංග්‍රහය | ආයතන සංග්‍රහය II , IV, V, VII, XII, XIII වන ඡේද |
| 2. මුදල් රෙගුලාසි | මුදල් රෙගුලාසි සංග්‍රහයේ I, II, III, IV, VI. VIII පරිච්ඡේද හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියා පරිපාටිය. |

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.02.23 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම : 02

**<u>මධ්‍යම පළාත් සභාවේ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ</u>**
**<u>පළාත් ඉඩම් සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා වන</u>**
**<u>දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය</u>**

1. විභාගයේ නම : මධ්‍යම පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ පළාත් ඉඩම් සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

2. විභාගය පිළිබඳ විස්තරය :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| විෂයානුබද්ධ අධ්‍යයනය | පැය 03 | 100 | 40 |

3. විභාගය පවත්වනු ලබන බලධාරියා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

4. විභාගය පවත්වනු ලබන කාල සීමාව : වසරකට අවම වශයෙන් එක් වරක්

5. විභාගය සඳහා විෂය නිර්දේශය :

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| විෂයානුබද්ධ දැනුම | 1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය අනුව පළාත් සභා වලට බලතල පැවරීම හා පළාත් සභා ක්‍රමය පිළිබඳ දැනුම.<br>2. ඉඩම් සංවර්ධන ආඥා පනත.<br>3. රජයේ ඉඩම් ආඥා පනත.<br>4. ඉඩම් ප්‍රධාන විශේෂ විධිවිධාන පනත.<br>5. ඉඩම් අත්පත් කර ගැනීමේ පනත.<br>6. රජයේ ඉඩම් සන්තකය ආපසු ගැනීමේ පනත. |

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.02.23 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :- නිර්දේශ කරමු

| | | |
|---|---|---|
| 01. ගාමිණී දසනායක මහතා | (සභාපති) | ............ |
| 02. ජී.ජී.එස්.ඒ.දිසානායක මිය | (සාමාජික) | ............ |
| 03. වී. නන්දකුමාර් මහතා | (සාමාජික) | ............ |
| 04. ඒ.ජේ.එම්.මොහිදින් නිස්තාර් මහතා | (සාමාජික) | ............ |
| 05. ඩබ්.එම්.එස්.ඩී.වීරකෝන් මයා | (සාමාජික) | ............ |

දිනය 2018.01.02

ආණ්ඩුකාර ලේකම්,

2018.01.02 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 18/25 යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද මධ්‍යම පළාත් සභාවේ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ පළාත් ඉඩම් සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2018.02.05

............
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

නිල මුද්‍රාව
ආර්. එම්. එන්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය : අනුමත කරමි. / නොකරමි.

අනුමත කරමි / නොකරමි

............
නිලූකා ඒකනායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
2018.02.23